
## මැදරට නගා සිටුවන

# "නැඩ්සා" ව්‍යාපාරය



"නැඩ්සා" ව්‍යාපාරයේ ජනපදිකයින් උදෙසා ඉදිවන නිවාස. ගල් වැටිවලින් ඉඩමේ පස සංරක්ෂණය කර ඇත.

අපේ කෘෂිකාර්මික බෝග විවිධාංගකරණය කිරීම කඩිනම් කෙරෙන පියවරක් ලෙස 1978 දී ජාතික කෘෂිකර්ම විවිධාංගකරණ සහ ජනපද අධිකාරිය පිහිටුවීම දැක්විය හැක. විදේශිකයන් උරුම කළ වැවිලි වගා නිසා වෙන් නිසරුව විනාශයට පත් වෙමින් තිබෙන මැද රට කඳු පළාත්වල ඉඩම් ජනතාසුභ සිද්ධියට හේතු වෙන පරිද්දෙන් සංවර්ධනය කිරීම හා පරම්පරා ගණනක් වතුකර ලයින් කාමරවල ලගිමින් කුලී කම්කරු දිවි පෙවෙත් ගත කළ ජනතාව ඉඩම් හිමි ජනපදිකයන් කරවීමේ උදර පියවරක් ක්‍රියාත්මක කරවීමත් මෙම නව ආයතනයට පැවරී ඇත.

නව අධිකාරියේ පරමාර්ථයන් මෙසේ කැටිකර දැක්විය හැක.

(අ) කෘෂිකාර්මික විවිධාංගකරණය ජනපද සංවර්ධනය සහ පූර්ණ සම්බන්ධිත දිය බෙත්ම කළමණාකරණය සඳහා සැලසුම් සකස් කිරීම හා එකී සැලසුම් ක්‍රියාවේ යෙදීම.

(ආ) අධිකාරිය වෙත පැවරෙන ඉඩම්වල හා රිම පලදව, පරිසරය රැකීම, ඉඩම් උප ජල සම්පත් සංරක්ෂණය සහ ජනපද සංවර්ධනය තහවුරු කිරීමේ පරමාර්ථ යන් කළමණාකරණය කිරීම.

(ඇ) කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම සහ අලෙවි කිරීම.

(ඇ) කෘෂිකාර්මික විවිධාංගකරණ සහ ජනපද සංවර්ධනය සඳහා පිරියතු උපකරණ සහ යන්ත්‍රෝපකරණ පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඉ) ඉහත සඳහන් පරමාර්ථයන් ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන සියළු ම පියවරයන් ක්‍රියාත්මක කිරීම වේ.

ආරම්භක පියවර වශයෙන් පාර්ලිමේන්තු ආසන පහක අක්කර 26,000 මේ අනුව සංවර්ධනය කිරීමට අධිකාරිය කටයුතු යොද ඇත. ගම්පොළ, නාවලපිටිය, හේවාහැට, යටියන්තොට හා අරණායක මෙම ආසන පහ වේ.

සෝද පාලුව නිසා ඉතා නිසරුව ඇති දුනට අඩු ආදයම් ලබා දෙන ඉඩම් සංවර්ධනය හා පස සංරක්ෂණය කර ආශ්‍රිත කැලෑ ඇති කර යහපත් පරිසරයක් තුළ කෝපි, ගම්මිරිස්, කරාබු, සාදික්කා, ඉඟුරු, කහ, කරදමුංගු, එළවළු, පළතුරු වැවීම සහ තණ බිම් සහිත කිරි පට්ටි ඇති කිරීම හා මෙම පහසුකම් උරුම කර ගත් ජනපදිකයන් කුඩා ගම් පොකුරු ලෙස පිහිටුවීම ජනපද අධිකාරියේ පොදු මහඟු සේවාව වනු ඇත. මෙම සේවාවන් ඉටු කිරීමේලා අවශ්‍ය වන රාජ්‍ය ආයතනවල හා දෙපාර්තමේන්තු වල සහාය ද මෙහිලා ලබා ගනු ඇත.

නිලඹ–අටබාගේ (ගම්පොල–හේවාහැට ආසන), මහඹය–කුඩාඹය (නාවලපිටිය), ගුරුගොඩ–රිටිගහ (අරනායක–යටියන්තොට), යන ජලාධාර ආශ්‍රිත ප්‍රදේශ තුනෙහි නිවහල් දිවි පෙවතකට ලැදියාව දක්වන පවුල් 5,000 කට නව දිවියකට මඟ මේ අනුව පෑදෙනු ඇත. ජන දිවියට අවශ්‍ය සියළු පහසුකම් සහිත ගම්මාන දෙසියයක් මේ යටතේ බිහි වනු ඇත. අධිකාරිය මගින් ම ඉදි කර දෙන නිවෙස්වල ජනතාව පදිංචි වූ පසු, ගල් කැඩීම, ගඩොල් කැපීම, ගොවි ආම්පන්න තැනීම, දුව සකස් කිරීම ඇතුළු වන කුඩා කර්මාන්ත ව්‍යාපාර ඇරඹීමෙන් ඔවුනට ඉඩමේ සුළු අපනයන බෝග ආදය මට අමතරව අතිරේක ආදයම් ලබා ගත හැකි මාර්ග ද සලකා දීමට කටයුතු කෙරෙනු ඇත.

**එක් ජනපදිකයෙකුට අක්කර කාලක ගෙවත්තයක් හා අක්කර දෙකයි, කාලක වගා බිමක් උරුම වනු ඇත. වර්ග අඩි දෙසියයකින් වන එක් කාමරයක්, ආලින්දයක්, මුළුතැන් ගෙයක් හා වැසිකිලියක් සහිත නිවසක් ද ඉදි කර දෙනු ලැබේ. මෙම නිවසක් ඉදි කිරීමට අධිකාරියට රුපියල් 5000–6000 අතර මුදලක් වැය වන අතර, වගා බිම් සහිතව එක් පවුලක් සඳහා රුපියල් 12,000 ක පමණ වැය වනු ඇත.**

වගා කටයුතු ජනපද අධිකාරියේ වගා සැලැස්මට අනුව සිදු කිරීමට ජනපදිකයන්ට සිදු වනු ඇත. සුළු අපනයන බෝග යටතේ යහපත් නිවහල් දිවියක් ගෙවීමට සරිලන ආදයමක් මේ වගා සැලැසිමට අනුකූලව කටයුතු කළ විට නියත ලෙසින් ම ලැබෙන නිසා ජනපදිකයන් ඊට නිතැතින් ම එකඟ වනු ඇතැයි අධිකාරියේ පරම විශ්වාසය යි. එක් වගා බිමකට යෝජනා වී ඇති වගා රටාව මෙසේ ය.

**ගම්මිරිස් පැල හෝ අතු 1,400 කෝපි 220, කොකෝවා 36, කරාබු 12, සාදික්කා 12, කොස් 3, අඹ 3, අලිපේර 3, දෙල් 3, කෙසෙල් 24, පුවක් 24, හා පැපොල් ගස් 44 කි. ඉහළ ම පලද තත්වයන් යටතේ මෙවැනි වගාවන් සහිත වගා බිමකින් වසර කට රුපියල් 30,000 ක ආදයමක් ලබා ගත හැකි වනු ඇත. මෙවැනි තත්වයකට නොපැමිණියත් අඩු තරමින් වසරකට රු. 18,500 ක් පමණ ආදයමක් ලබා ගැනීමේ ලා ඔවුනට කිසිදු බාධාවක් ඇති විය නොහැක.**

ජනපදිකයන්ට මෙම වගා රටාව නව දැනුම මිනුම යටතේ පවත්වා ගැනීමට උප කාරි වන සුළු අපනයන බෝග පර්යේෂණ මධ්‍යස්ථානයක් දල්පිටියේ පිහිටුවා ඇත. සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව මගින් දැනටමත් වැඩ අරඹා ඇති මෙම අක්කර 50 මධ්‍යස්ථානය ජනපදිකයන්ට අවශ්‍ය පුහුණුව හා ආදර්ශ සේවා ලබා දෙනු ඇත. මෙහි මහ පෙන්වීමට යටතේ තම වගා බිම් සකස් කර ගැනීමට ජනපදික යන්ට සිදු වන අතර, උඩරට ජනතාවට හුරු පුරුදු 'උඩරට මිශ්‍ර ගෙවතු' බිහි කිරීමට කිසිසේත්ම ඉඩ නොදෙනු ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට රුපියල් දශ ලක්ෂ සියයක් වැය වනු ඇතැයි ගණන් බලා තිබේ. ජාත්‍යන්තර සංවර්ධන ආයතනය මින් දශ ලක්ෂ 72 ක් ණයක් දෙන අතර, අප රජය ඉතිරි දශ ලක්ෂ 28 වැය කරනු ඇත.

විශාල මහජන මුදල් සම්භාරයක් වැය කර බිහි කරන ජනතා ව්‍යාපාරයක උපරිම ප්‍රතිඵල ආපසු ලබාගත හැකි එකම මහ මෙය බව ද අධිකාරියේ ප්‍රකාශකයෙක් පැවසීය. මෙම බිම්වල අස්වැන්න මිළට ගැනීම ද අධිකාරිය මගින් කෙරෙන නිසා ජනපදිකයන් අතරමැදියන් ගේ සූරා කෑම් වලට ලක් නොවෙනු ඇත. ඉඩම් පවරා දී ජනපදිකයන් තනි කර නොගොස් ඔවුන් තම බිම්වල නියම අයිතිකරුවන් වන තුරු අවශ්‍ය සේවා හා රැකවරණය ලබා දීම ද ජනපද අධිකාරිය කටයුතු කරනු ඇත.

සැලැස්ම යටතේ කඳුරට පහත් පෙදෙස් වල මිශ්‍ර වගා බිම් 2,550 ක්, ඉහළ පෙදෙස් වල කිරි පට්ටි සහිත වගා බිම් 1,300 ක්, කරදමුංගු වගා බිම් 390 ක් හා සුළු තේ වතු බිම් 230 ක් බිහි වනු ඇත. එක ගම් පොකුරකට පවුල් 20–30 අතර ප්‍රමාණ යක් අයත් වනු ඇත. ජනපදිකයන් පදිංචි කරවීමෙන් පසු මුල් තුන් වසර තුළ ඔවුනට මසකට රුපියල් 300 නොඅඩු ආදායමක් ලැබෙන සේ එය සංරක්ෂණය ජලාප්‍රවාහනය නිවෙස් හා පාර ඉදි කිරීම් හා නඩත්තු වැනි සේවාවල රැකියා ඉඩ සැල සෙනු ඇත.

**වගා බිම්වල ආදායම් ලැබීමත් සමඟ ම මෙම සේවා ආදායම් වෙනුවට ඔවුනට රු. 500–1500 දක්වා වූ ආදායම් ලබා ගැනීම මේ වාසනාව හිමි වනු ඇත. මෙම ආදායම් තමන්ට ලබා ගැනීමට අලසකම් දුරුකර දැතේ විරියෙන් පෙරට එන ජනපදිකයන් පරම්පරා ගණනක් උරුමව තිබූ කම්කරු දිවි පෙවෙත දුරලන්නන් පමණක් නොව, අප වහලුන් කළ වැවිලි ආර්ථිකයෙන් ජාතිය බේරාගන්නා නව පරපුරක් වනු නිසැක ය.**